# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ ජාතික ධනයෙන් ඉතා විශාල ප්‍රමාණයක් සෑම වර්ෂයකදීම අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරනු ලැබේ. ඒ අනුව විශාල මානව, මූල්‍ය හා භෞතික සම්පත් ප්‍රමාණයක් යොදවා ඇති ක්ෂේත්‍රයක් බවට අධ්‍යාපන ක්ෂේත්‍රය පත්ව තිබේ. ජාතියක අනාගතය තීරණය කරන දරු පරම්පරාවක් නිර්මාණය කිරීමේ වගකීම පාසල තුළින් අපේක්ෂා කෙරෙයි. වර්තමානයේ පාසලේ කාර්යභාරය අන් කවරදාටත් වඩා දැඩි අවශ්‍යතාවයක් බවට පත්ව තිබෙන්නේ පාසල නැමැති ආයතනය වර්තමානය වන විට තරඟකාරී ආයතනයක් බවට පත්ව තිබෙන බැවිනි. විශේෂයෙන් ම ජාත්‍යන්තර පාසල් අන් කවරදාටත් වඩා නාගරික ප්‍රදේශ ආක්‍රමණය කරමින් ග්‍රාමීය ප්‍රදේශ කරාද ව්‍යාප්ත වෙමින් පවතියි. තරඟකාරීත්වයට මුහුණ දීමට අපහසු ග්‍රාමීය පාසල් වැසී යාමේ තර්ජනයට මුහුණ දී සිටියි. මේ සඳහා බලපාන්නා වූ සාධක අතර පාසලක ඵලදායීතාවයද හේතු වන බව පැවසිය හැකිය. රජය වසරක් පාසා වැය කරන ජාතික ධනය ඵලදායී නොවන ආයතන වෙනුවෙන් වැය කිරීමේ සම්බන්ධව දෙවරක් සිතා බැලිය යුතු අවස්ථා ඉදිරියේදී එළඹෙනු ඇත. පාසල කාර්යක්ෂම ඵලදායී ආයතනයක් බවට පත් කිරීම පාසලේ පරිපාලනයට මෙන්ම සමස්ත ගුරු සිසු සියළු දෙනාගේම වගකීමක් බවට පත්ව තිබේ. ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ හැකි සාර්ථක වැඩ පිළිවෙලක් ලෙස විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුන්වා දිය හැකිය. ඒ අනුව පාසලක ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් කෙසේ ඉවහල් වේද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික පරමාර්ථය විය.

මෙම අධ්‍යයනය මූලික අරමුණු හතරක් පදනම් කරගෙන ක්‍රියාත්මක කරන ලදී. පළමු අරමුණ වූයේ පාසල තුල දැනට ක්‍රියාත්මක කෙරෙන විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහ එහි ක්‍රියාත්මක මට්ටම පිළිබඳ සොයා බැලීමයි. දෙවන අරමුණ මගින් පාසල් තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ඵලදායී ලෙස භාවිතා වන්නේ දැයි සොයා බලන ලදී. තෙවන අරමුණ ඉටු කර ගැනීම සඳහා පාසල් ඵලදායීතාවය සහ හා විෂය සමගාමී ක්‍රියාකාරකම් අතර සබඳතාවය සොයා බලන ලදී. සිව්වන අරමුණ මගින් පාසලේ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවිය හැකි ක්‍රම පිළිබඳව විමසා බලන ලදී. විෂය සමගාමී ක්‍රියාකාරකම් හා ඵලදායීතාව සම්බන්ධ මාතෘකාවන් අර්ථ විවරණය පෙර අපර දෙදිග සාහිත්‍ය ප්‍රයෝජනයට ගනිමින් දෙවන පරිච්ඡේදයේදී සිදු කර තිබේ.

විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ගීකරණය කර ඇති ආකාරය, එහි නව ප්‍රවණතාවයන් සම්බන්ධයෙන් සාහිත්‍ය විමර්ශණය සිදු කර තිබේ. ඵලදායිතා සංකල්පය හඳුන්වා දී පාසලක ඵලදායීතාවය නිර්මාණය කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල් ඵලදායිතාවය අතර සම්බන්ධතාවය සාහිත්‍ය විමර්ශණය මගින් පෙන්වා දී ඇත. ඒ අනුව පාසලක ඵලදායීතාවයට විෂය සමගාමී ක්‍රියාකාරකම් දායක කර ගත හැකි ආකාරය සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් ලබා ගත හැකි විය.

පර්යේෂණ මාතෘකාවට අනුව දෙනියාය අධ්‍යාපන කලාපයට අයත් මොරවක, පස්ගොඩ හා කොටපොල යන අධ්‍යාපන කොට්ඨාස තෝරා ගන්නා ලදී. නියැදියට අයත් පාසල් සංඛ්‍යාව 08 කි. එම පාසල් 08 අධ්‍යාපන කොට්ඨාස තුන ම ආවරණය වන පරිදි තෝරා ගෙන ඇත. එමෙන්ම නාගරික හා ග්‍රාමීය පාසල් නියෝජනය වන පරිදි නියැදි අන්තර්ගතය සකස් කරගෙන තිබේ. ලංකාවේ පාසල් වර්ගීකරණයට අයත් සියළුම පාසල් වර්ග එනම් 1AB වර්ගයේ ජාතික පාසල් හා ජාතික නොවන පාසල්, 1C වර්ගයේ පාසල් 2 වර්ගයේ පාසල් සහ 3 වර්ගයේ පාසල් වශයෙනි. නියැදිය සඳහා විදුහල්පතිවරුන් (08) ගුරුවරුන් (16) සිසුන් (80) නියැදිය තුළ ඇතුලත් විය.

පර්යේෂකයා පර්යේෂණයට අදාල දත්ත ලබා ගැනීම සඳහා විදුහල්පතිවරුන්, ගුරුවරුන්, සිසුන් සහ දෙමව්පියන්ට ප්‍රශ්නාවලියක් ලබා දීමෙන්ද සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන්ද තොරතුරු ලබා ගන්නා ලදී. ලිඛිත මූලාශ්‍රය හා නිරීක්ෂණ ෂෙඩ්‍යුලයන් ද දත්ත රැස් කිරීම සඳහා භාවිතා කරන ලදී. රැස් කරගන්නා ලද දත්ත වගු, ප්‍රතිශත මගින් විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමය යටතේ විශ්ලේෂණය කරන ලදී.

දත්ත විශ්ලේෂණය තුළින් නිගමන රාශියකට එළඹිය හැකි වූ අතර ඒ අනුව විසඳුම් යෝජනාද ඉදිරිපත් කළ හැකි විය. පාසලක ඵලදායීතාවයට විෂය සමගාමී ක්‍රියාකාරකම් සෘජුවම දායක කරගත හැකි බව හඳුනාගත හැකි විය. පාසල් තුළ ක්‍රියාත්මක විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රමාණවත් නොවන බවත්, සිසුන්ට ක්‍රියාශීලීව සම්බන්ධ විය හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් රාශියක් හඳුන්වා දිය යුතු බවත් යෝජනා විය. දෙවන වර්ගයේ සහ තුන්වන වර්ගයේ පාසල් වල විෂය සමගාමී ක්‍රියාකාරකම් වල තත්ත්වය ද බෙහෙවින් කනගාටුදායක වන අතර එම පාසල් ඵලදායීතාවයෙන්ද අඩු පාසල් වශයෙන් හඳුනාගත හැකි විය. පාසලක ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් සෘජු ලෙසම දායක කරගත හැකි අතර, ඒ සඳහා යොදා ගත හැකි විසඳුම් යෝජනා ඉදිරිපත් කරන ලදී. අවසානයේ පසු පර්යේෂණ අවශ්‍යතාවය සඳහා අවස්ථාවන්ද ඉදිරිපත් කර තිබේ.